# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2034/31 - 2017 අගෝස්තු මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2017.08.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය* : VSW/DS/LB/ACQU/MANI/POLICE/02.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම්/පරවශතාව ලබාගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන *ඉඩමේ/පරවශතාවේ විස්තර*:

| | |
|---|---|
| කැබලි අංකය | - කැබලි අංක 01 |
| ඉඩමේ නම | - කුසවන් පිප්පිරි |
| ප්‍රාථමික සැලසුම | - යා 2862/2017.03.06 |
| පිහිටීම | - මානිපායි බටහිර J/140 |
| ප්‍රා.ලේ. කොට්ඨාසය | - වලිකාමම් නිරිත, සන්දිලිප්පායි |
| දිස්ත්‍රික්කය | - යාපනය |
| පළාත | - උතුර |

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: කුසවන් පිප්පිරි; විස්තරය: ලඳු කැලය; හිමිකම් කියන්නා: මානිප්පායි නාගලිංකම් තම්බිරාජාගේ උරුම කරුවන්(ඇටර්නි බලකරුගේ නම කදිරවේළු ගෞරිකාන්තන්); ප්‍රමාණය: හෙක්. 0.1026

ඉහත සඳහන් *ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 දෙසැම්බර් මස 20 දින *පෙ.ව. 10.00ට වලිකාමම් නිරිත, සන්දිලිප්පායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2017 දෙසැම්බර් මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී *ඉඩම/පරවශ්‍යතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ජසෝදා උදයකුමාර්,
ප්‍රාදේශීය ලේකම්,
වලිකාමම් නිරිත, සන්දිලිප්පායි කොට්ඨාසය.

2017 අගෝස්තු මස 29 වැනි දින,
වලිකාමම් නිරිත, සන්දිලිප්පායි,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09– 397

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* : KDS/PJP/4/4/2/W/81.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2015/WS/132.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේගම්පහකෝරළේ සුළු කොට්ඨාසයේ, ගල්හින්න ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2017.05.03 දිනැතිව මැන සකස් කරන ලද අංක මහ 6580 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් සඳහන් දොඩම්ගස්හින්න නැමැති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0568ක් පමණ වන පහත සඳහන් මායිම්වලින් යුත් ඉඩම් කොටස;

**කැබලි අංක 01**
ඉඩමේ නම: දොඩම්ගස්හින්න; ප්‍රමාණය: හෙක්. 0.0568;

*මායිම්*:
*උතුරට* : මූ.පි. මහ 6521 හි කැබලි අංක 2, 1 සහ කේ. බී. ඒකනායක හිමිකම් කියන අලගොඩයාදෙමට; *නැගෙනහිරට* : ඒ. එම්. සරීනා හිමිකම් කියන ඉඩම; *දකුණට* : ඒ. එම්. සරීනා හිමිකම් කියන ඉඩම සහ මාර්ගය (ප්‍රාදේශීය සභාව); *බටහිරට* : මූ.පි. මහ 6521 හි කැබලි අංක 2.

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් : එම්. එච්. ජී. නයිමා, අංක 267/2, පාසැල් පාර, ගල්හින්න.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 ඔක්තෝබර් මස 25 වැනි දින ප.ව. 1.00ට පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017 ඔක්තෝබර් මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එම්. ඩබ්ලිව්. එම්. එම්. මඩහපොල,
ප්‍රාදේශීය ලේකම්,
පූජාපිටිය.

2017 අගෝස්තු මස 25 වැනි දින,
පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09– 398

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

උතුරු පළාතේ, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, පච්චිලෙයිපලෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුහමාලේ ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ පිහිටි මූලික පිඹුරු අංක KI.150 දරන පිඹුරේ කැබලි අංක 01.

**කැබලි අංක 01**
ඉඩමේ නම: අයනකේයි ගිණිකොන ඉඩම; විස්තරය: භූමිය ස්ථිර ගොඩනැගිලි 19 කින් සමන්විතයි; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම/JEDB; ප්‍රමාණය: හෙක්. 6.6547.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයකට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 නොවැම්බර් මස 22 දින පෙ.ව. 10.00ට පච්චිලෙයිපලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017 නොවැම්බර් මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම්,
පච්චිලෙයිපලෙයි කොට්ඨාසය.

2017 අගෝස්තු මස 29 වැනි දින,
පච්චිලෙයිපලෙයි,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09– 399

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : KDS/HAR/4/2/1/45.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/9/2015/WS/140.

මහනුවර හා තදාසන්න ජල සම්පාදන ව්‍යාපෘතියේ කටුගස්තොට ජල පවිත්‍රාගාර සංකීර්ණයේ නිල නිවාස

පිටුපසින් විකල්ප ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීමට අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම් විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මන සියපත්තුව සුළු කොට්ඨාසයේ, පොල්වත්ත ගමේ පිහිටි, මහනුවර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන පිළියෙල කරන ලද අංක 320461 දරන කැඩැස්තර සිතියමේ දැක්වෙන හෙක්ටයාර් 0.0069 ක් පමණ වූ ඉඩම් කැබලි 02.

01. **කැබලි අංක 200**
ඉඩමේ නම: —; හිමිකම් කියන අය: මහා භාරකාර, මහා භාරකාර දෙපාර්තමේන්තුව, කොළඹ 7, විහාරාධිපතීන් වහන්සේ, කොණ්ඩදෙනිය රජමහා විහාරය, කොණ්ඩදෙණිය; ප්‍රමාණය: හෙක්. 0.0044.

02. **කැබලි අංක 201**
ඉඩමේ නම: කැටතැලගහහේන *නොහොත්* කිරිවල්ගොඩහින්න; හිමිකම් කියන අය: මහා භාරකාර, මහා භාරකාර දෙපාර්තමේන්තුව, කොළඹ 7, විහාරාධිපතීන් වහන්සේ, කොණ්ඩදෙනිය රජමහා විහාරය, කොණ්ඩදෙණිය; ප්‍රමාණය: හෙක්. 0.0025.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 නොවැම්බර් මස 13 වැනි දින පෙ.ව. 10.00ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2017 නොවැම්බර් මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ජේ. එම්. ජේ. කේ. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව.

2017 අගෝස්තු මස 28 වැනි දින.
නුගවෙල, හාරිස්පත්තුව,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09– 400

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.